**ලංසු කැඳවීම**

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

**සර්වේයර් ජනරාල් කාර්යාලයේ සුහසාධක ආපනශාලා සේවය ලබාගැනීම**

**ලංසු අංකය SD/V/2026**

01. මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2026/2027 වර්ෂය සඳහා සර්වේයර් ජනරාල් කාර්යාලයේ සුහසාධක ආපනශාලා සේවය ලබා ගැනීමට අදාළ ප්‍රසම්පාදනය සඳහා සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා සහිත ලංසු ඉදිරිපත් කිරීමට කරනු ලබන ආරාධනයයි.

| විස්තරය | සර්වේයර් ජනරාල් කාර්යාලයේ සුහසාධක ආපනශාලාව පැවැත්වීම<br>**(2026/2027 වර්ෂවල වසරක කාලයක් සඳහා)** |
|---|---|
| **ලංසු සුරක්ෂණය (රු.)** | **50,000.00** |
| **ලංසු සුරක්ෂණය වලංගු කාලය** | 2026.10.02 දින සිට 2026.12.18 දින දක්වා වලංගු විය යුතුය |
| **ආපසු නොගෙවන ලංසු පත්‍ර ගාස්තුව (රු.)** | 1,000.00 |
| **ලංසු කැඳවීමේ ලේඛන කට්ටලය සහ අයදුම්පත කාර්යාල වේලාවන් තුළ ලබාගත යුතු දිනය සහ වේලාව** | 2026-09-18 වන දින සිට 2026-10-01 දින දක්වා පෙ.ව.9.00 සිට ප.ව. 3.00 දක්වා |
| **පූර්ව ලංසු රැස්වීම** | 2026-09-25 දින පෙ.ව. 10.00ට සර්වේයර් ජනරාල් කාර්යාලයේදී |
| **ලංසු තැබීම අවසන් කිරීම** | 2026-10-02 දින පෙ.ව. 9.30 |
| **ලංසු විවෘත කිරීම** | 2026-10-02 දින පෙ.ව. 9.35<br>ප්‍රසම්පාදන හා සැපයීම් අංශය |
| **ලංසු වලංගු කාලය** | 2026-10-02 දින සිට 2026-11-20 දක්වා වලංගු විය යුතුය |

02. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ පටිපාටිය මත සිදු කෙරේ.

03. ඒ සඳහා උනන්දුවක් දක්වන ලංසු තබන්නන් හට පහත ලිපිනයේදී කාර්යාල වේලාවන් තුල ලංසු කැඳවීමේ ලිපි ලේඛන පරික්ෂා කළ හැකි අතර දුරකථන අංක 011-2368106 ඇමතීමෙන් වැඩිදුර තොරතුරු ලබා ගත හැක.

04. ලංසු කැඳවීමේ සම්පූර්ණ ලේඛණ කට්ටලය සහ අයදුම්පත උක්ත වගුවෙහි සඳහන් පරිදි ගෙවීම් කර පහත ලිපිනය වෙතින් ලබා ගත හැකිය.

05. සකස් කල ලංසු පත්‍ර (පිටපත් දෙකකින් යුක්ත විය යුතුය) ඇතුලත් කරන ලද කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි "සර්වේයර් ජනරාල් කාර්යාලයේ සුහසාධක ආපනශාලාව සඳහා ලංසු කැඳවීම-2026/2027" ලෙස සඳහන් කර මුද්‍රා තැබූ ලිපි කවර උක්ත වගුවෙහි සඳහන් ලංසු තැබීම අවසන් කිරීම ට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. උක්ත වගුවෙහි සඳහන් පරිදි මිල ගණන් විවෘත කරනු ලබන අතර , මිල ගණන් ඉදිරිපත් කළ අය හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතවරයෙකුට එම අවස්ථාවට සහභාගි විය හැක. සියලුම ලංසු ඉහත වගුවෙහි සඳහන් ලංසු සුරැකුම් ගාස්තු වලින් සමන්විත විය යුතුය.

06. ඉදිරිපත් කරන ලංසු/යෝජනා වලංගු කාලය ලංසු විවෘත කරන දින සිට දින 49 කට නොඅඩු විය යුතුය.

07. ඇනවුම ලැබී මාස 1/2 (සති 02) ක් ඇතුළත අදාල සේවාව ලබා දීම ආරම්භ කළ යුතු අතර එදින සිට අවුරුද්දක කාලයක් සේවාව සැපයීම කළ යුතුය.

08. **ලිපිනය:** ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (ප්‍රසම්පාදන හා සැපයීම්), සර්වේයර් ජනරාල් කාර්යාලය, නො: 150, කිරුළ පාර, කොළඹ 05. දුරකතන / ෆැක්ස් : 0112 -368106

සර්වේයර් ජනරාල්
සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
2026.09.18